JMC vLearning
"your virtual learning partner"

# සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන

## AAT අදියර III

### FAR - මූල්‍ය වාර්තාකරණය

සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917




# AAT 3

# මූල්‍ය වාර්තාකරණය

Sandeepa Jayasekera

MBA (PIM-SJP), B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner.

JMC vLearning your virtual learning partner

## සමාගම් ගිණුම්කරණය හැඳින්වීම

## ගිණුම්කරණය පිළිබඳ සමාගම් පනතේ අවශ්‍යතාවය




මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තා තබාගත යුතුය.

ගිණුම් වාර්තා තුල

- මුදල් ලැබීම් ගෙවීම්
- වත්කම් වගකීම්
- තොග
- ගැනුම් සහ විකුණුම් පිළිබඳ වාර්තා තිබිය යුතුය



මූල්‍ය ප්‍රකාශ තුල ලාභාලාභ සහ මූල්‍ය තත්ත්වය සත්‍ය සහ සාධාරණව නිරූපණය විය යුතුය.

JMC vLearning "your virtual learning partner"

# ප්‍රාග්ධනය



## සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය

සමාගමක් තම හිමිකම් ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් නිකුතුවක් මඟින් රැස් කරයි.

සාමාන්‍ය කොටස්වල ආයෝජනය කරන්නන් සමාගමේ අයිතිකරුවන් බවට පත්වේ.



JMC vLearning
"your virtual learning partner"

# සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය




කොටස් සඳහා නාමික අගයක් නොමැති අතර නිකුත් කළ වටිනාකමට හඳුනාගනී. කොටසක නිකුතු අගය එකවර හෝ කිහිපවරකදී ලබාගත හැකිය.

කිහිපවරකදී ලබාගත හැකි ආකාර,

- අයදුමේදී (කොටස් මිල දී ගැනීමට අයදුම් කරන විට)
- විභජනයේදී (කොටස් අයදුම්කරුවන් අතර බෙදන විට)
- ඇරයුමේදී (ඉතිරි මුදල ගෙවීමට ඇරයුම් කරන විට)

# ප්‍රශ්න 01

ප්‍රවීන් සමාගම එකක් රු. 20 බැගින් වන කොටස් 1,000,000 ක් නිකුත් කරන ලදී. කොටසක නිකුතු වටිනාකම වන රු. 20 ගෙවිය යුත්තේ අයදුමේදී රු. 10 ක්, විභජනයේදී රු. 5 ක් සහ ඇරයුමේදී රු. 5 ක් ලෙසය.

- 20X9/01/01 දිනය වන විට කොටස් 1,500,000 ක් සඳහා අයදුම් ලැබී තිබූ අතර 20X9/02/01 දින අතිරික්තය ප්‍රතික්ෂේප කර මුදල් නැවත ගෙවන ලදී.
- 20X9/02/15 වන එදින කොටස් විභජනය කළ අතර 20X9/03/15 වන දින ඇරයුමෙන් ලැබිය යුතු මුදල් ලබා ගන්නා ලදී.

ඉහත ගණුදෙනු සඳහා ගිණුම් සටහන් දක්වන්න.

8

Sandeepa Jayasekera - JMC

JMC vLearning "your virtual learning partner"

# සාමාන්‍ය කොටස් ලාභාංශ

ලාභාංශ යනු සමාගමේ ලාභයෙන් කොටස්හිමියන්ට කරන බෙදාහැරීමයි. එය කොටසකට ලාභාංශයක් හෝ කොටස් වටිනාකමට ප්‍රතිශතයක් ලෙස තීරණය කළ හැකිය.

උදාහරණ:

- කොටසකට ලාභාංශ රු. 2/- කි.
- 5% බැගින් වන ලාභාංශ




# සාමාන්‍ය කොටස් ලාභාංශ

සාමාන්‍ය කොටස්හිමියන් ව්‍යාපාරයේ අයිතිකරුවන් වේ. එමනිසා ව්‍යාපාරයේ අවදානම ඔවුන් දරා ගනී.

ව්‍යාපාරය ලබන ලාභය මත සාමාන්‍ය කොටස්හිමියන්ට ගෙවන ලාභාංශය තීරණය වේ. ඒ අනුව ලාභාංශ නොගෙවීමට අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවිය හැකිය.


සමස්ත ලාභයම ලාභාංශ ලෙස ගෙවන්නේ නැති අතර ලාභාංශ හැර ඉතිරි ලාභය ව්‍යාපාරය තුල රඳවා ගනී.



# වරණීය කොටස් ප්‍රාග්ධනය

වරණීය අයිතිවාසිකම් හිමිවන කොටස් විශේෂයක් ලෙස වරණීය කොටස් හැඳින්විය හැකිය.

සාමාන්‍ය කොටස් තුලින් අයිතිය නිරූපණය වුවද වරණීය කොටස්හිමියන්ට ඡන්ද අයිතියක් නැති අතර සමාගමේ අයිතිය නිරූපණය නොවේ.




# ප්‍රශ්න 02

වරණීය කොටස් සහ සාමාන්‍ය කොටස් අතර ඇති වෙනස්කම් මොනවාද?

Sandeepa Jayasekera - JMC 12

# ප්‍රශ්න 03

වෙනුජ් සමාගම රු. 2 බැගින් සාමාන්‍ය කොටස් 100,000 ක් සහ 5% ක ලාභාංශ සහිත රු. 1 වරණීය කොටස් 50,000 ක් නිකුත් කර තිබුණි. 20X1 මාර්තු 31 න් අවසන් වර්ෂය තුල සමාගම විසින් රු. 100,000 ක බදු පසු ලාභයක් උපයා තිබුණි. සාමාන්‍ය කොටස්හිමියන්ට අයත් ලාභයෙන් 50% ක ලාභාංශ ගෙවීමට තීරණය කරන ලදි.

**අවශ්‍ය වන්නේ:**

- මුළු ලාභාංශ,
- රඳවාගත් ලාභය



# ප්‍රශ්න 04

නීතා සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 2,000,000/- ක් වන අතර ඉන් නිකුත් කර ඇති ප්‍රාග්ධනය රු. 1,500,000 කි. 5% ක සාමාන්‍ය ලාභාංශ ප්‍රතිශතයක් තීරණය කර ඇති නම් ගෙවිය යුතු ලාභාංශ ගණනය කරන්න.

# කොටසක වෙළඳපොල අගය

සමාගමක් කොටස් නිකුත් කළ පසු කොටස්හිමියන් අතරේ විවිධ මිල ගණන් වලට කොටස් හුවමාරු විය හැකිය. එසේ කොටස්හිමියන් අතර කොටස් අතර කොටස් ගණුදෙනු සිදුවන කොටස් වෙළඳපොලේ ගණුදෙනු වන මිල කොටසක වෙළඳපොල වටිනාකමයි.

කොටසක නිකුතු අගය සහ සහ වෙළඳපොල අගය වෙනස්විය හැකිය. එවැනි වෙනස්කම් තුලින් සමාගමකට බලපෑමක් නැති නිසා එම වෙනස්කම් ගිණුම් තැබිය යුතු නැත.



# ණයකර සහ බැඳුම්කර




සමාගම් තම දිගුකාලීන ප්‍රාග්ධනය සපයා ගැනීමට මහජනතාවට ණයකර සහ බැදුම්කර නිකුත් කරයි. මේවා ණය ප්‍රාග්ධනය ලෙස හඳුන්වයි.

## ණය ප්‍රාග්ධනය සහ කොටස් ප්‍රාග්ධනය අතර සැසඳීමක්

| විස්තරය | කොටස් ප්‍රාග්ධනය | ණය ප්‍රාග්ධනය |
|---|---|---|
| ප්‍රාග්ධනය සපයන්නේ | අයිතිකරුවන් වන කොටස්හිමියන්ය | ණය සම්පාදකයන්ය |
| ප්‍රතිලාභය | ලාභය | පොළිය (ස්ථිර පොලී අනුපාත) |
| ප්‍රතිලාභය නොගෙවූ විට | ලාභාංශ නොගෙවීම අයිතිකරුවන් දරාගනී | නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිය |
| ඇප | නැත | වත්කම් ඇප තැබිය හැක |
| අවදානම | වැඩිය | අඩුය |
| ඈවර කිරීමේදී ප්‍රමුඛතාවය | අවසානයට පියවයි | කොටස්හිමියන්ට පෙර පියවයි |



## ප්‍රශ්න 05

තිළිණි සමාගම රු. 1,000,000 ක ණයකර 15% පොලී අනුපාතයක් යටතේ නිකුත් කර ඇත. සෑම වර්ෂයකම ජුනි 30 සහ දෙසැම්බර් 31 දින පොලී ගෙවනු ලබයි. මුල්‍ය වර්ෂය මාර්තු 31 න් අවසන් වන්නේ නම් පොලී වියදම සහ උපචිත පොලිය ගණනය කරන්න.

# හිමිකම

- **ප්‍රාග්ධනය** – සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය සහ හිමිකම් ස්වරූපයේ වරණීය කොටස් ප්‍රාග්ධනය
- **සංචිත** – ව්‍යාපාරය උපයන ලද අයිතිකරුවන්ට නොබෙදූ, විවිධ අරමුණු වෙනුවෙන් තබා තිබෙන ලාභ.
  - **ප්‍රත්‍යාගණන සංචිත** – LKAS 16 දී පැහැදිලි කළ ලාභාංශ ලෙස ගෙවිය නොහැකි අතිරික්ත
  - **රඳවාගත් ලාභ** – ව්‍යාපාරය ලද ලාභයෙන් ලාභාංශවලින් පසු ඉතිරි කරගත් ලාභය
  - **සංචිත** – සංචිත සඳහා වර්ෂයේ ලාභයෙන් මාරු කිරීම් සිදු කරයි.
    - **ව්‍යවස්ථාපිත සංචිත** – නීතිමය අවශ්‍යතා මත පවත්වාගෙන යන සංචිත. ලාභාංශ ලබාදිය නොහැක.
    - **ව්‍යවස්ථාපිත නොවන සංචිත** – විවිධ අරමුණු (ආයෝජන) සඳහා පවත්වාගෙන යන සංචිත. අවශ්‍ය නම් ලාභාංශ සඳහා යොදාගත හැකිය.

Sandeepa Jayasekera - JMC

# ප්‍රසාද නිකුතු




සමාගමකට තම ප්‍රකාශිත ප්‍රාග්ධනය වැඩි කිරීමට ප්‍රසාද නිකුතුවක් භාවිතා කළ හැකිය. මෙහිදී සිදුවන්නේ සමාගමේ දැනට සිටින කොටස්හිමියන්ට නොමිලයේ කොටස් නිකුත් කිරීමයි.

JMC vLearning
"your virtual learning partner"

## ප්‍රසාද නිකුතු

කොටස්හිමියන්ට නොමිලයේ ලැබෙන කොටස්, කොටස් වෙළඳපොලේ විකුණා මුදල් කරගෙන හැකිය. එමනිසා සමාගම ලාභාංශ ගෙවීම් වෙනුවට ප්‍රසාද නිකුතු සිදු කරයි.

ප්‍රසාද නිකුතුවක් මූල්‍යනය කිරීමට කොටස්වල වටිනාකම සංචිත වලින් ප්‍රකාශිත ප්‍රාග්ධනයට මාරු කරයි. එනම් සංචිත ප්‍රාග්ධනිත වේ. සංචිත අඩුවීම නිසා අනාගත ලාභාංශද අඩු වේ. නමුත් ප්‍රසාද නිකුතුවකදී සමාගමට මුදල් ජනනය වන්නේ නැත.




**ද්විත්ව සටහන**

| | |
|---|---|
| සංචිත | හර |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | බැර |

## ප්‍රශ්න 06

හයිලන්ඩ් සමාගමේ දිනට මූල්‍ය තත්ත්වය පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. 1/-) | 20,000 |
| ප්‍රත්‍යාගණිත සංචිත | 14,000 |
| රඳවාගත් ලාභ | 16,000 |
| | 50,000 |

සෑම කොටස් 4 කට 1 බැගින් ප්‍රසාද නිකුතුවක් සිදු කරන ලදී.

**අවශ්‍ය වන්නේ,**

ප්‍රසාද නිකුතුවේ වටිනාකම, එහි ද්විත්ව සටහන සහ ප්‍රසාද නිකුතුවට පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශ උද්ධමනය.

# හිමිකම් නිකුතුව



හිමිකම් නිකුතුවේදී සමාගම විසින් දැනට සිටින කොටස්හිමියන්ට, කොටසක වෙළඳ මිලට වඩා අඩු මිලකට කොටස් නිකුත් කරනු ලබයි. කොටස්හිමියන් ඒවා සිය කැමැත්ත අනුව මිලදී ගෙන වෙළඳපොල මිලට විකුණා ලාභයක් උපයාගනී.


සමාගම පැත්තෙන් හිමිකම් නිකුතුවක් තුලින් ප්‍රකාශිත ප්‍රාග්ධනය ඉහළ යන අතර මුදල් ද සමාගම තුලට ගලා ඒ.

# හිමිකම් නිකුතුව

සමාගම පැත්තෙන් හිමිකම් නිකුතුවක් තුලින් ප්‍රකාශිත ප්‍රාග්ධනය ඉහළ යන අතර මුදල් ද සමාගම තුලට ගලා ඒ.

| ද්විත්ව සටහන | |
|---|---|
| මුදල් / බැංකු | හර |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | බැර |

Right Issue



# ප්‍රශ්න 07

20X9/03/31 දිනට රෝජා සමාගමේ මූල්‍ය තත්ත්වය පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. 1) | 16,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 14,000 |
| රඳවාගත් ලාභ | 20,000 |
| | 50,000 |

රෝජා සමාගම රු. 1.20 බැගින් සෑම කොටස් 4 කටම 1 බැගින් හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී.

**අවශ්‍ය වනුයේ,**

කොටස් නිකුත් කිරීමට අදාළ ද්විත්ව සටහන සහ නිකුතුවෙන් පසු ගලපන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උද්ධෘතයන් පෙන්වන්න.

Sandeepa Jayasekera - JMC 25

# ප්‍රශ්න 08

හිල්මා සමාගමේ 20X9/03/31 දිනට ප්‍රාග්ධන ව්‍යුහය පහත පරිදි වේ.

| | |
|---|---|
| රු. 2 බැගින් වන සාමාන්‍ය කොටස් 100,000 | 200,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 70,000 |
| රඳවාගත් ඉපැයීම් | 230,000 |
| | 500,000 |

පහත එක් එක් අවස්ථාවට පසු ප්‍රාග්ධන ව්‍යුහය දක්වන්න.

1. කොටස් 2 කට 1 බැගින් ප්‍රසාද කොටස් නිකුතුවක්
2. ප්‍රසාද නිකුතුවට පසු සියළුම හිමිකම් ලබාගන්නේ යැයි සලකා එකක් රු. 2.50 බැගින් කොටස් 3 කට 1 බැගින් වන සේ හිමිකම් නිකුතුවක්.

Sandeepa Jayasekera - JMC 26

JMC vLearning "your virtual learning partner"

## ප්‍රසිද්ධ කිරීම සඳහා වූ සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශ
## Financial Statements of a Limited Company for Publishing

Sandeepa Jayasekera - JMC 27

## ලාභාලාභ ගිණුම සහ වෙනත් විස්තීර්ණ ප්‍රකාශ ආකෘතිය

Sandeepa Jayasekera - JMC 28

JMC vLearning "your virtual learning partner"

Sandeepa Jayasekera - JMC

XXX PLC
20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
ලාභාලාභ ගිණුම සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | සටහන් | රු. |
|---|---|---|
| විකුණුම් | | XXX |
| විකුණුම් පිරිවැය | | (XX) |
| **දළ ලාභය** | | XX |
| වෙනත් ආදායම් | 01 | X |
| පරිපාලන වියදම් | | (XX) |
| බෙදාහැරීම් වියදම් | | (XX) |
| වෙනත් වියදම් | 02 | (XX) |
| මූල්‍ය වියදම් | 03 | (XX) |
| **බදු පෙර ලාභය** | 04 | XX |
| බදු | | (X) |
| **බදු පසු ලාභය** | | XX |

29

Sandeepa Jayasekera - JMC

| | සටහන් | රු. |
|---|---|---|
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | |
| දේපළ පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණය ලාභය | | X |
| විකිණීම සඳහා තබා තිබෙන මූල්‍ය වත්කම්හි සාධාරණ අගය නැවත මැනීමේදී ඇතිවන ලාභ හෝ අලාභ | | X/(X) |
| නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් තත්වාගණනය මත ඇතිවන ලාභ හෝ අලාභ | | X/(X) |
| විදේශීය ඒකකවල මූල්‍ය වාර්තා දේශීය මුදලට පරිවර්තනය කිරීමේ ලාභා හෝ අලාභ | | X/(X) |
| | | |
| **මුළු විස්තීර්ණ ආදායම** | | XX |

30

# මූල්‍ය තත්ව ප්‍රකාශ ආකෘතිය

Sandeepa Jayasekera - JMC 31

XXX PLC
20X0 මාර්තු 31 දිනට
මූල්‍ය තත්ව ප්‍රකාශය

Sandeepa Jayasekera - JMC

| | සටහන් | රු. | රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 05 | XX | |
| අස්පෘශ්‍ය වත්කම් | | XX | |
| පරිපාලිතයන්ගේ ආයෝජන | | XX | |
| අනිකුත් මූල්‍ය වත්කම් | | XX | XX |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 06 | XX | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 07 | XX | |
| අනිකුත් ජංගම වත්කම් | | XX | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 08 | XX | XX |
| **මුළු වත්කම්** | | | XXX |

32

JMC vLearning "your virtual learning partner"

| | සටහන් | රු. | රු. |
|---|---|---|---|
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | XX | |
| රඳවාගත් ලාභ | | XX | |
| ප්‍රත්‍යාගණන සංචිත | | XX | XX |
| **ජංගම නොවන වගකීම්** | | | |
| අනිකුත් මූල්‍ය වගකීම් | | XX | |
| පොළී දරණ ණයගැනීම් | | XX | |
| වරණීය කොටස් | | XX | XX |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | XX | |
| උපචිත වියදම් | | XX | |
| පොළී දරණ ණයගැනීම් වල ජංගම කොටස | | XX | XX |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | | XXX |



# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශ ආකෘතිය

XXX PLC
20X0 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ලාභ | ප්‍රත්‍යාගණන සංචිතය | එකතුව |
|---|---|---|---|---|
| **20X9.04.01 දිනට ශේෂය** | XX | XX | XX | XX |
| කොටස් නිකුතුව | XX | | | XX |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | XX | | XX |
| ප්‍රත්‍යාගණන ලාභ | | | XX | XX |
| ලාභාංශ | | (X) | | (X) |
| **20X0.04.01 දිනට ශේෂය** | XX | XX | XX | XX |

JMC vLearning
"your virtual learning partner"

# ගිණුම් සටහන්

| 01. වෙනත් ආදායම් | රු. |
|---|---|
| දේපළ පිරියත සහ උපකරණ ඉවත්කිරීම් ලාභ | XX |
| ස්ථාවර තැන්පතු පොළී | XX |
| ලාභාංශ ආදායම | XX |
| | XX |

| 02. වෙනත් වියදම් | රු. |
|---|---|
| දේපළ පිරියත සහ උපකරණ ඉවත්කිරීම් අලාභ | XX |
| වත්කම් හානිකරණ අලාභ | XX |
| තොග හානිවීම් | XX |
| | XX |

| 03. මූල්‍ය වියදම් | රු. |
|---|---|
| වරණීය කොටස් ලාභාංශ | XX |
| බැංකු ණය පොළී | XX |
| බැංකු අයිරා පොළී | XX |
| | XX |

| 04. බදු පෙර ලාභයේදී පහත වියදම්ද අඩු කර ඇත | රු. |
|---|---|
| අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය | XX |
| විගණන ගාස්තු | XX |
| සේවක වැටුප් | XX |
| ක්ෂය | XX |
| හානිකරණ අලාභ | XX |





දේපළ පිරියත සහ උපකරණ

| | ඉඩම් | ගොඩනැගිලි | යන්ත්‍ර | මෝටර් රථ | ලී බඩු | එකතුව |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ප්‍රත්‍යාගණිත අගය** | | | | | | |
| 2019.04.01 ශේෂය | XX | XX | XX | XX | XX | XXX |
| එකතු කිරීම් | | XX | XX | | | XXX |
| ප්‍රත්‍යාගණනය කිරීම | XX | | | | | XXX |
| ඉවත්කිරීම් | | | | (X) | | (X) |
| 20X0.04.01 දිනට **ශේෂය** | XX | XX | XX | XX | XX | XXX |
| **ක්ෂයවීම්** | | | | | | |
| 2019.04.01 ශේෂය | XX | XX | XX | XX | XX | XXX |
| වසරේ ක්ෂයවීම් | | XX | XX | XX | XX | XXX |
| ප්‍රත්‍යාගණනය කිරීම | | | | | | |
| ඉවත්කිරීම් | | | | (X) | | (X) |
| 20X0.04.01 දිනට **ශේෂය** | XX | XX | XX | XX | XX | XXX |
| ධාරණ අගය | XX | XX | XX | XX | XX | XXX |

JMC vLearning "your virtual learning partner"

| 06. තොග | රු. |
|---|---|
| අමු ද්‍රව්‍ය | XX |
| නොනිමි තොග | XX |
| නිමි තොග | XX |
| | XX |

| 07. වෙළඳ ලැබිය යුතු දෑ | රු. |
|---|---|
| වෙළඳ ණයගැතියෝ | XX |
| (-) හානිකරණ වෙන්කිරීම් | XX |
| | XX |

| 08. මුදල් සහ මුදල් සමාන දෑ | රු. |
|---|---|
| කෙටිකාලීන ආයෝජන | XX |
| බැංකු ශේෂය | XX |
| අතැති මුදල් | XX |
| | XX |

Sandeepa Jayasekera - JMC 39

# ප්‍රශ්න 09

**සීමාසහිත ගජබා පොදු සමාගමේ** 20X7 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත වේ.

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය : සාමාන්‍ය කොටස් 2,000,000 | | 20,000 |
| නිදහස් කළ හැකි වරණීය කොටස් ප්‍රාග්ධනය (කොටස් 1,000,000) | | 5,000 |
| 20X6 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම | | 6,500 |
| දේපළ, පිරියත සහ උපකරණ - (පිරිවැයට) | | |
| ඉඩම සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම - රු. 20,000,000/-) | 25,000 | |
| මෝටර් වාහන | 15,000 | |
| කාර්යාල උපකරණ | 4,000 | |
| 20X6 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 2,000 |
| මෝටර් වාහන | | 6,000 |
| කාර්යාල උපකරණ | | 2,600 |

Sandeepa Jayasekera - JMC 40

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| 20X7 මාර්තු 31 දිනට තොගය (පිරිවැයට) | 9,500 | |
| වෙළඳ ලැබිය යුතු මුදල්/වෙළඳ ගෙවිය යුතු මුදල් | 11,000 | 6,000 |
| 20X5/X6 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බදු | | 400 |
| බැංකු ණය | | 3,000 |
| බැංකුවේ ඇති මුදල් | 3,000 | |
| අතැති මුදල් | 200 | |
| 20X6 අප්‍රේල් 01 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 1,500 |
| විකුණුම් පිරිවැය/විකුණුම් | 107,000 | 160,000 |
| ගෙවූ අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස් | 2,000 | |
| නිදහස් කළ හැකි වරණීය කොටස් මත ගෙවූ ලාභාංශ | 500 | |
| පරිපාලන වියදම් | 11,460 | |
| බෙදාහැරීමේ වියදම් | 16,740 | |
| මූල්‍ය වියදම් | 5,600 | |
| ගෙවූ ආදායම් බදු | 2,000 | |
| | **213,000** | **213,000** |



පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) වර්ෂය තුල සමාගම විසින් පහත සඳහන් වත්කම ඉවත් කරන ලදි

| මිලට ගත් දිනය | වත්කම | පිරිවැය (රු.) | ඉවත් කළ දිනය | විකිණීමෙන් ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| 01.10.20X3 | බෙදාහැරීමේ වෑන් රථය | 2,300,000 | 31.12.20X6 | 1,200,000 |

විකිණීමෙන් ලද මුදල, බැංකු ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර ඇත. ඒ හැර වෑන් රථය ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(2) 20X7 මාර්තු 31 දින සමාගම විසින් එහි ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය හේතුවෙන් ගොඩනැගිල්ලේ වටිනාකම රු. මිලියන 2 කින් ඉහළ ගියේය. මේ සම්බන්ධයෙන් පොත්වල කිසිදු සටහනක් තබා නොමැත.

(3) 20X7 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 9,375,000/- කි.

(4) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලබයි. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකළ පහත පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිල්ල | : අවුරුදු 25 |
| මෝටර් වාහන | : අවුරුදු 04 |
| කාර්යාල උපකරණ | : අවුරුදු 08 |



JMC vLearning "your virtual learning partner"

(5) වෙළඳ ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් පහත සඳහන් ගැලපිලි සිදුකළ යුතුය.

■රු. 1,000,000/- ක වෙළඳ ලැබිය යුතු මුදල් ශේෂයක් වර්ෂය තුල බොල්ණය බවට පත්විය. කෙසේවෙතත්, අදාල වෙළඳ ලැබිය යුතු මුදල සඳහා අඩමාණ ණය ලෙස පසුගිය වර්ෂයේ පොත්වල අඩමාන ණය සඳහා වු ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි.

■20X7 මාර්තු 31 දිනට ඉතිරි වෙළඳ ලැබිය යුතු මුදල්වලින් 5% ක පොදු ප්‍රතිපාදනයක් කළ යුතුය.

(6) පහත සඳහන් වියදම් 20X7 මාර්තු 31 දිනට පොත්වල උපචිත කළ යුතු වේ

| | රු. |
|---|---|
| දුරකතන සහ විදුලි වියදම් | 60,000 |
| ප්‍රචාරණය | 200,000 |

(7) 20X7 මාර්තු 31 දිනට හිඟව ඇති බැංකු ණය ශේෂයෙන් 1/2 ක ප්‍රමාණයක් ඊළඟ වර්ෂය තුල ගෙවිය යුතුය.

(8) 20X6/X7 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වගකීම රු. 3,500,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(9) 20X7 මැයි 31 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ, 20X7 මාර්තු 31 දිනට පැවති සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු. 1/- බැගින් වු අවසාන ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදි.



(10) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 20X7 ජුනි 15 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදි

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ගජබා පොදු සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න.**

(a) 20X7 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය) (ලකුණු 10)

(b) 20X7 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 07)

(c) 20X7 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 03)

(d) 20X7 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 05)

(මුළු ලකුණු 25)

# ප්‍රශ්න 10

**සීමාසහිත ඩයමන්ඩ් පොදු සමාගමේ** පොත්වලින් 2020 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත.

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 6,000,000) | | 60,000 |
| 2019 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 19,300 |
| **දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට:** | | |
| ඉඩම් සහ ගොඩනැගිලි (ඉඩමේ පිරිවැය රු. මිලියන 38) | 45,000 | |
| පිරියත සහ යන්ත්‍ර | 10,250 | |
| කාර්යාල උපකරණ | 6,300 | |
| **2019 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිලි | | 4,500 |
| පිරියත සහ යන්ත්‍ර | | 3,700 |
| කාර්යාල උපකරණ | | 2,100 |
| 2020 මාර්තු 31 දිනට තොගය | 35,300 | |
| වෙළඳ ලැබිය යුතු මුදල්/වෙළඳ ගෙවිය යුතු මුදල් | 18,100 | 17,100 |



| (රු.'000) | හර | බැර |
|---|---|---|
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 8,350 | |
| 2019 අප්‍රේල් 01 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 3,000 |
| ඉදිරියට කළ ගෙවීම් | 6,000 | |
| ගෙවූ ආදායම් බදු | 4,200 | |
| ගෙවූ අතුරු ලාභාංශ - සාමාන්‍ය කොටස් | 6,500 | |
| විකුණුම් පිරිවැය/විකුණුම් | 205,000 | 281,000 |
| වෙනත් ආදායම් | | 6,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 2,750 |
| පරිපාලන වියදම් | 34,550 | |
| බෙදාහැරීමේ වියදම් | 24,400 | |
| මූල්‍ය වියදම් | 2,400 | |
| බැංකු ණය | | 2,500 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම්) | | 4,400 |
| | **406,350** | **406,350** |



JMC vLearning "your virtual learning partner"

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත

(1) 2020 මාර්තු 31 දිනට තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු. 34,875,000/- ක් විය.

(2) සමාගමට රු. 500,000/- ක් අයවිය යුතුව තිබූ ගනදෙනුකරුවෙක් 2020 මැයි 20 දින බංකොලොත්භාවයට පත්ව ඇති අතර, එම මුදල ඔහුගෙන් අයකරගත නොහැකි තත්ත්වයට පත් විය. මේ සම්බන්ධයෙන් කිසිදු වෙන් කිරීමක් පොත්වල සටහන් කොට නොමැත. තවද, 2020 මාර්තු 31 දිනට පැවති ඉතිරි වෙළඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 10% ක ලැබිය යුතු මුදල් වෙනුවෙන් ප්‍රතිපාදනයක් පවත්වාගෙන යාම තීරණය කරන ලදී.

(3) 2019/2020 මූල්‍ය වර්ෂයට අදාල විගණන ගාස්තුව වන රු. 400,000/- ක මුදල ගිණුම්ගත කොට නොමැති අතර, 2020 සම්පූර්ණ ලිත් වර්ෂය වෙනුවෙන් දරණ ලද රක්‍ෂණ වියදම, ඉදිරියට කළ ගෙවීම ගිණුමේ පෙන්නුම් කෙරේ.

(4) සමාගම විසින් 2018 අප්‍රේල් 01 දින රු. 500,000 කට මිලදී ගත් යන්ත්‍රයක් 2020 මාර්තු 31 දින රු. 350,000/- කට විකුණනු ලැබීය. යන්ත්‍රය විකිණීමෙන් ලද මුදල, මුදල් පොතට හරකොට යන්ත්‍ර ගිණුමට බැරකොට ඇත. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් පොත්වල තබා නොමැත.



(5) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | : වර්ෂ 50 |
| පිරියත සහ යන්ත්‍ර | : වර්ෂ 04 |
| කාර්යාල උපකරණ | : වර්ෂ 05 |

(6) 2020 මාර්තු 31 දින සමාගම විසින් හානිකරණ පරීක්ෂාවක් (impairment test) සිදු කරනු ලැබූ අතර, කාර්යාල උපකරණවල ඉවත් කිරීමේ වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකම රු. 2,540,000/- ක් බව එමඟින් අනාවරණය විය. කාර්යාල උපකරණවල භාවිතයට ගැනීමේ අගය (value in use) රු. 2,800,000/- කි. මෙම හානිකරණය සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් පොත්වල සිදුකර නොතිබුණි.

(7) 2020 මාර්තු 31 දින, සමාගම විසින් එහි ඉඩම රු. 40,000,000/- කට ප්‍රත්‍යාගණනය කළ අතර, එය පොත්වල වාර්තාකර නොතිබුණි.

(8) 2020 මාර්තු 31 දිනට පැවති බැංකු ණය ශේෂයෙන් 1/2 ක් 2020/21 වර්ෂය තුලදී පියවිය යුතු වේ.

(9) 2018/19 වර්ෂයට අදාල මුළු ආදායම් බදු වගකීම රු. 2,750,000/- ක් වූ එම මුදල 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී ගෙවා දැමූ අතර, එය ගෙවූ ආදායම් බදු ගිණුමේ ගිණුම්ගතකොට ඇත. 2019/20 වර්ෂයට අදාල මුළු ආදායම් බදු වගකීම රු. 3,300,000/- ක් වනු ඇති බවට ඇස්තමේන්තු කොට ඇත

(10) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 ජුනි 30 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත ඩයමන්ඩ් සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න.**

(a) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශය) (ලකුණු 10)

(b) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 08)

(c) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 03)

(d) 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 25)

Sandeepa Jayasekera - JMC 49

# ප්‍රශ්න 11

**සීමාසහිත නසීන් සමාගමේ** පොත්වලින් 2021 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත.

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ පිරිවැය - රු. මිලියන 25) | 37,500 | |
| පිරියත සහ යන්ත්‍ර | 6,250 | |
| මෝටර් වාහනය | 9,600 | |
| 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 7,500 |
| පිරියත සහ යන්ත්‍ර | | 3,750 |
| මෝටර් වාහනය | | 5,000 |
| 2021 මාර්තු 31 දිනට තොගය | 8,920 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 14,180 | |
| අත්තිකාරම් ගිණුම | 2,806 | |

Sandeepa Jayasekera - JMC 50

| (රු.'000) | හර | බැර |
|---|---|---|
| ඉදිරියට කළ ගෙවීම් | 1,200 | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 805 | |
| බැංකු ණය | | 3,600 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම්) | | 1,250 |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | | 6,800 |
| 2020 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 720 |
| වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 3,000 |
| මෝටර් රථය විකිණීමෙන් ලද මුදල | | 4,500 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 67,760 | 100,400 |
| අධ්‍යක්ෂ ගාස්තු | 1,200 | |
| විගණන ගාස්තු | 270 | |
| වෙනත් පරිපාලන වියදම් | 10,240 | |
| බෙදාහැරීමේ වියදම් | 7,210 | |



| (රු.'000) | හර | බැර |
|---|---|---|
| පොලී වියදම් | 718 | |
| ගෙවූ ආදායම් බදු | 2,000 | |
| ගෙවූ අතුරු ලාභාංශ | 1,000 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 700,000) | | 7,000 |
| 2020 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 28,139 |
| | 171,659 | 171,659 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ.



JMC vLearning "your virtual learning partner"

| | |
|---|---|
| ගොඩනැගිලි | : වර්ෂ 50 |
| පිරියත සහ යන්ත්‍ර | : වර්ෂ 05 |
| මෝටර් වාහන | : වර්ෂ 05 |

(2) ගිණුම් පොත්වල පිරිවැය ලෙස රු. මිලියන 9.6 ක් ලෙස සඳහන් වන වන මෝටර් රථය 2020 දෙසැම්බර් 31 දින රු. මිලියන 4.5 කට විකුණන ලදි. මෝටර් රථය විකිණීමෙන් ලද මුදල් සටහන් කිරීම හැර අනෙකුත් සටහන් ලෙජර් ගිණුම්වල වාර්තාකොට නොතිබුණි. මෙම මෝටර් රථය විකිණීමෙන් ලද මුදල, මෝටර් රථය විකිණීමෙන් ලද මුදල් ගිණුමේ වාර්තා කොට ඇත.



(3) 2020 අප්‍රේල් 01 දින, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ අනුව නව මෝටර් රථයක් මිලදී ගෙන තිබුණි. කල්බදු ක්‍රමයට ලබාගත් මෝටර් රථයේ සාධාරණ අගය රු මිලියන 5 ක් වන අතර, කල්බදු කාල සීමාව වර්ෂ 5 කි. වාර්ෂික කල්බදු වාරිකය රු. 806,000/- ක් වන අතර, එය සෑම වර්ෂයකම මාර්තු 31 දින ගෙවිය යුතු වේ. කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතය 11% ක් වේ. කල්බදු කාලසීමාවෙන් පසුව මෝටර් රථයේ හිමිකාරීත්වය **සීමාසහිත නසීන් සමාගමට** හිමි වේ. මේ සඳහා කරන ලද මූලික ගෙවීම වන රු. මිලියන 2 සහ ගෙවනු ලැබූ පළමු කල්බදු වාරිකය වූ රු. 806,000/- ක මුදල, අත්තිකාරම් ගිණුමේ වාර්තා කර ඇත. ඊට අමතරව මේ සම්බන්ධයෙන් වෙනත් සටහනක් ගිණුම් පොත්වල සිදුකර නොමැත.

(4) 2021 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා ගෙවනු ලැබූ කුලිය, ඉදිරියට කළ ගෙවීම් ගිණුම තුළ අඩංගු වේ. මාසික කුලිය රු. 100,000/- කි.



JMC vLearning "your virtual learning partner"

(5) පහත සඳහන් වියදම්, 2021 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල උපචිත / ප්‍රතිපාදන කර නොමැත.

- 2021 මාර්තු මාසයට අදාල අන්තර්ජාල සහ දුරකතන බිල්පත් - රු. 55,000/-
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම් - රු. 500,000/-

(6) 2021 මාර්තු 31 දිනට බැංකු ණය ගිණුමේ ශේෂයෙන් 1/2 ක් 2021/22 වර්ෂය තුලදී ගෙවා නිම කළ යුතුය.

(7) 2021 මාර්තු 31 දිනට, දින 360 කට වඩා කල් ඉකුත් වූ රු. මිලියන 2.5 ක් හිඟව ඇති ගනුදෙනුකරුවෙක් සිටී. මෙම මුදල සඳහා දැනටමත් ගිණුම් පොත්වල ප්‍රතිපාදන සිදුකොට ඇත. කෙසේ නමුත්, එම ගනුදෙනුකරුවා විසින් එම මුදලෙන් රු. මිලියන 2.2 ක් වූ 2021 අප්‍රේල් මාසයේදී පියවූ අතර, ඉතිරි මුදල බොල් ණය ලෙස 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුල දී ලියා හැරීමට සමාගම තීරණය කොට ඇත.

Sandeepa Jayasekera - JMC 55

(8) 2020/21 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වගකීම, රු. මිලියන 1.5 ක් ලෙස ඇස්තමේන්තු කොට තිබේ.

(9) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මැයි 30 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත නයීන් සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න.**

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය) (ලකුණු 10)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 09)

(c) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 02)

(d) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු 04)

Sandeepa Jayasekera - JMC 56